සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2018
# පුරවැසි අධ්‍යාපනය

**06 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකය:

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1- 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.

---

01. පාසලේ මුල්ම ශිෂ්‍යයා පිළිබඳ තොරතුරු දැනගැනීම අවශ්‍ය වූ අවස්ථාවක ඔබ පරීක්ෂා කළ යුතු වඩාත් නිවැරදි මූලාශ්‍රය වන්නේ ................................................ .
(ලොග් සටහන් පොත් / ඇතුළත් වීමේ ලේඛන / නාම ලේඛන )

02. පරිපාලන බෙදීම් අනුව ශ්‍රී ලංකාවේ කුඩාම පරිපාලන ඒකකය භාරව කටයුතු කරනු ලබන්නේ ........................ ................................................ තුමා ය.
(ප්‍රාදේශීය ලේකම් / දිස්ත්‍රික් ලේකම් / ග්‍රාම නිලධාරි)

03. ජීව දත්ත තොරතුරු පත්‍රිකාවක් මගින් හඳුනාගනු ලබන්නේ ශිෂ්‍යයෙකුගේ ........................................ ය.
(පවුලේ තොරතුරු / පෞද්ගලික තොරතුරු / පාසලේ තොරතුරු)

04. භෞතික සම්පත් සංරක්ෂණය සඳහා ගත හැකි වඩා යෝග්‍ය ක්‍රියාමාර්ගයක් වන්නේ, ........................................ කිරීමයි. (රුක් රෝපණය / පොලිතින් භාවිතය / පෝස්ටර් නිර්මාණය)

05. පාසලකට නීති පද්ධතියක් අවශ්‍ය වන්නේ ................................................ සඳහා ය.
(නායකත්වයට ගරු කිරීම / සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම / පාසල ක්‍රමවත්ව පාලනය කිරීම)

- පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද, ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. ආත්මාවබෝධය හා සැලසුම්කරණය ශිෂ්‍යයාගේ චරිත සංවර්ධනයට ඉවහල් වේ. ( )
07. සිසු දක්ෂතා සංවර්ධනය කර ගැනීමේ අයිතිය පාසල් සමාජයෙන් ලැබෙන අයිතිවාසිකමකි. ( )
08. ශිෂ්‍යයන් තුළ සැමවිටම යහපත් අරමුණු පැවතීම සමස්ථ සමාජයේ අයහපතට හේතු වේ. ( )
09. ස්වභාවික සම්පත් පරිහරණයේදී ඒවාට හානිදායක වන අයුරින් ද ක්‍රියාකිරීම අවශ්‍ය වේ. ( )
10. නියමිත බල ප්‍රදේශය තුළ මංමාවත් ඉදිකිරීම හා නඩත්තු කිරීම පළාත්පාලන ආයතන මගින් සිදුවන සේවාවක් වේ. ( )

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. පාසලේ අනන්‍යතාවය පිළිබිඹු කරන සංකේත දෙකක් පමණක් ඇතුළත් පිළිතුර තෝරාන්න.
(1) පාසල් ගීය / ජාතික ගීය
(2) පාසල් ලාංඡනය/ ජාතික ගීය
(3) පාසල් ලාංඡනය / රාජ්‍ය ලාංඡනය
(4) පාසල් නිල ඇඳුම / පාසල් කොඩිය

12. ශිෂ්‍යයෙකු සතු හැකියා දක්ෂතා වැඩි දියුණු කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු වැදගත් ම ක්‍රියා මාර්ගය වන්නේ මින් කුමක් ද?
(1) විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගේ අත්දැකීම් හා දැනුම ලබා ගැනීම.
(2) රූපවාහිනී වැඩසටහන් නැරඹීම.
(3) සමවයස් කණ්ඩායම් සමඟ නිරන්තරයෙන් එකතුවීම.
(4) පවුලෙන් හා සමාජයෙන් ඉවත්ව හුදෙකලාව කටයුතු කිරීම.

13. පාසල් සංවර්ධන කමිටුවේ සභාපතිත්වය හිමි වන්නේ,

(1) නියෝජ්‍ය විදුහල්පතිතුමාට ය. (2) මූල්‍ය සහකාර නිලධාරී මහතාට ය.

(3) විදුහල්පති තුමාට ය. (4) අංශ ප්‍රධාන ගුරුතුමාට ය.

14. පහත දැක්වෙන පිළිතුරු වලින් මහ නගර සභා දෙකක් පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) කුලියාපිටිය, කරුණෑගල (2) කුරුණෑගල ,මහනුවර

(3) මහනුවර, පොල්ගහවෙල (4) කුරුණෑගල, පොල්ගහවෙල

15. සැලසුම් සහගත ශිෂ්‍යයා නියමිත වේලාවට පෙර පාසලට යාම සඳහා අනුගමනය කළ යුතු හොඳම ක්‍රියාමාර්ගය වන්නේ මින් කුමක් ද?

(1) ප්‍රමාද වී නින්දට යාම. (2) වේලාසනින් නින්දට යාම.

(3) ප්‍රමාද වී අවදි වීම. (4) වේලාසනින් නින්දට යාම හා අවදි වීම.

- මෙහි දක්වා ඇති පින්තූර ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

16. A පින්තූරයෙන් දැක්වෙන අවස්ථාවට අදාලව ශිෂ්‍යයෙකු වන ඔබ විසින් සිදුකළ යුතු කාර්යයන් දෙකක් ලියන්න.

1. ..............................................................................

2. ..............................................................................



A

17. පංති කාමරයේදී සිසුන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමේදී සිසුන් තුළ ප්‍රදර්ශනය විය යුතු ගුණාංග දෙකක් දක්වන්න.

1. ..............................................................................

2. ..............................................................................



B

18. B පින්තූරයෙන් දැක්වෙන අවස්ථාවකදී සිදුවිය හැකි හදිසි අනතුරු දෙකක් ලියන්න.

1. ..............................................................................

2. ..............................................................................

19. B පින්තූරයේ දැක්වෙන අවස්ථාවට ඔබ සම්බන්ධ වුවහොත් ඔබ තුළ වර්ධනය වන ගුණාංග දෙකක් ලියන්න.

1. ..............................................................................

2. ..............................................................................

20. B පින්තූරයෙන් දැක්වෙන ආකාරයට පාසලේදී ඔබ සම්බන්ධ වූ එවැනි අවස්ථා දෙකක් සඳහන් කරන්න.

1. ..............................................................................

2. ..............................................................................

# පුරවැසි අධ්‍යාපනය - II

## II කොටස


- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.


A

01. (i) A පින්තූරයෙන් දැක්වෙන අවස්ථාව නම් කරන්න. (ල. 02)

(ii) එවැනි අවස්ථාවකදී ඔබට උදව් වන පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)

පහත A, B, C, D පින්තූර ඇසුරින් (iii) සහ (iv) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(iii) කායික හැකියා ප්‍රදර්ශනය වන පින්තූර නම් කරන්න. (ල. 02)

(iv) මානසික හැකියා ප්‍රදර්ශනය වන පින්තූර නම් කරන්න. (ල. 02)

(v) E පින්තූරයෙන් දැක්වෙන අවස්ථාව නම් කරන්න. (ල. 02)

(vi) එවැනි අවස්ථාවක සිදුකරන බෞද්ධ ආගමික චාරිත්‍රය දක්වන්න. (ල. 02)


E

(vii) E පින්තූරයේ දැක්වෙන අවස්ථාවට උදව් කරන ස්වෙච්ඡා සංවිධාන දෙකක් නම් කරන්න. (ල. 02)

(viii) සාමුහිකව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල. 02)

02. (i) පාසල් සංවිධාන ව්‍යුහය තුළ ඇති වෙනත් සංවිධාන හතරක් ලියන්න. (ල. 04)

(ii)

| |
|---|
| ඩෙස් පුටු/ ගුරු භවතුන් / පෙළ පොත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්/ නියෝජ්‍ය විදුහල්පති පුස්තකාලය/ විද්‍යාගාරය |

ඉහත චතුරස්‍රය තුළ සඳහන් තොරතුරු ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| භෞතික සම්පත් | මානව සම්පත් |
|---|---|
| 1. ........................................................................ | 1. ........................................................................ |
| 2. ........................................................................ | 2. ........................................................................ |
| 3. ........................................................................ | 3. ........................................................................ |
| 4. ........................................................................ | 4. ........................................................................ |

(ල. 07)

03. 'විෂ්මිත' 6 ශ්‍රේණියේ ඉගෙන ගන්නා ශිෂ්‍යයෙකි. ඔහු නිතර සිසුන් සමග කළහකාරි ලෙස හැසිරෙයි. ගුරුවරුන්ට නිතර බොරු කියන සුළු දෙයට පවා කේන්ති යන දරුවෙකි.

(i) ඉහත සඳහන් ඡේදයේ දැක්වෙන 'විශ්මිත' සිසුවා තුල දක්නට ලැබෙන දුර්වලතා 3ක් නම් කරන්න.

(ල. 03)

(ii) ඔබ සඳහන් කළ විශ්මිතගේ දුර්වලතා අවම කර ගැනිම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග 3ක් ලියන්න.

(ල. 03)

(iii) (අ) ඔබට නිවසේදී මුහුණ පෑමට සිදුවන අභියෝග අවස්ථා 3ක් සඳහන් කරන්න. (ල. 03)


(ආ) එම අභියෝග ජය ගැනිම සඳහා ඔබ ගන්නා ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ල. 02)

04. (i) පහත ''අ'' තිරුවේ සඳහන් පුද්ගලයින් හා සම්බන්ධ තොරතුරු ''ආ'' තිරුවෙන් නිවැරදිව ගලපා යා කරන්න.


| ''අ'' | ''ආ'' |
|---|---|
| 1. සේනක බිබිලේ | ලිපිනය තහවුරු කර ගැනිම |
| 2. නියෝජ්‍ය විදුහල්පති | සිසුන්ගේ සෞඛ්‍ය පරීක්ෂාව |
| 3. ග්‍රාම නිලධාරී | රාජ්‍ය ඔසුහල පිහිටුවීම |
| 4. සී. ඩබ්. ඩබ්. කන්නන්ගර | ගුරු ඇගයීම් කටයුතු |
| 5. මහජන සෞඛ්‍ය පරීක්ෂක | නිදහස් අධ්‍යාපනයේ පියා |

(ල. 05)


(ii) පහත ත්‍රිකෝණයේ සඳහන් යුතුකම් හා අයිතිවාසිකම් හඳුනාගෙන හිස්තැන් පුරවන්න. (ල. 06)




යුතුකම්




අයිතිවාසිකම්




05. (i) පාසල විවිධ අවස්ථාවලදී සම්බන්ධතා පවත්වන පුද්ගල කණ්ඩායම් හතරක් නම් කරන්න. (ල. 04)

(ii) පාසල මගින් අවට ප්‍රජාව දැනුවත් කිරීම සඳහා යොදාගත හැකි වැඩසටහන් 3ක් ලියන්න. (ල. 04)

(iii) (අ) සිසුන්ගේ සාරධර්ම වර්ධනය සඳහා ඔබ පාසලේ ක්‍රියාත්මක කරන වැඩසටහන් දෙකක් නම් කරන්න. (ල. 02)

(ආ) ඒ සඳහා පාසල සම්බන්ධ කරගන්නා ආගමික නායකයින් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)

06. (i) ඔබ ජීවත්වන ප්‍රදේශයේ ස්වේච්ඡා සමිති 3ක් නම් කරන්න. (ල. 03)

(ii) පහත දැක්වෙන A තීරුවට ගැළපෙන යුතුකම් B තීරුවෙන් නිවැරදිව සොයා A තීරුවේ හිස්තැන් මත ඉංග්‍රීසි අක්ෂර ලියන්න. (ල. 08)

**A තීරුව**

සේවා සපයන අයගේ යුතුකම්

1. ..............................................
2. ..............................................
3. ..............................................
4. ..............................................

සේවා ලබන අයගේ යුතුකම්

1. ..............................................
2. ..............................................
3. ..............................................
4. ..............................................

**B තීරුව**

A බදු මුදල් නිසිපරිදි ගෙවීම.

B නිසි අයුරින් සේවා ලබාදීම.

C කාර්යක්ෂමව කටයුතු කිරීම.

D සේවාවට ගරු කිරීම හා ස්තුති කිරීම.

E සාධාරණව කටයුතු කිරීම.

F අයථා අයුරින් සේවා ලබා නොගැනීම

G සේවා සපයන ආයතන හා දේපළ රැක ගැනීම

H අපක්ෂපාතීව කටයුතු කිරීම


07. පහත දැක්වෙන උපකාරක පද ඇසුරු කර ගනිමින් පහත ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

<u>පහළට</u>

2. සැලසුම්කරණය තුළින් මෙය ඉතිරි වේ.
3. ජීවිතය ජය ගැනීමට කටයුතු කිරීමේදී මේවා හමුවේ
5. ගුරුවරු සිසුන්ට මේවා ලබාදිය යුතුයි.
7. ඛනිජ තෙල් මේ සඳහා යොදා ගැනේ.
8. ස්වේච්ඡා සමිතියකි.

<u>හරහට</u>

1. දරුවාට නිවස හා සමාන ස්ථානයකි.
3. ඔබ තුළ නිතරම මේවා තිබිය යුතුයි.
4. ඔබට දැනුම ලබාගත හැකි තාක්ෂණික උපකරණයකි.
6. පාසල් සංවිධාන ව්‍යුහය සකස් කිරීමේදී මේ පිළිබඳ සංඛ්‍යා සලකා බලයි.
9. සිසුන් මේවා භුක්ති විඳීම වෙනුවෙන් යුතුකම් වගකීම් ඉටුකළ යුතු ය.
10. භෞතික සම්පත් ආශ්‍රිත නිෂ්පාදනයකි



## I කොටස

01. ඇතුලත් වීමේ ලේඛනය 02. ග්‍රාම නිලධාරී 03. පෞද්ගලික තොරතුරු 4. රුක් රෝපණය
05. පාසල ක්‍රමවත්ව පාලනය කිරීම. 06. ✓ 07. ✓ 08. × 09. × 10. ✓ 11. 4
12. 1 13. 3 14. 2 15. 4
16. හොඳින් ඇහුන්කන්දීම, නිශ්ශබ්දව සිටීම, අන් අයට කරදර නොකිරීම ආදී ගැළපෙන පිළිතුරු
17. හුණු පුවරුව, හුණු කොට්ටය, පොත් රාක්ක, හුණු කැල්ල, ගුරු පුටු, ගුරු මේස ආදී ගැළපෙන පිළිතුරු (2 x 20 = 40)
18. තුවාල වීම, ක්ලාන්ත වීම, තැලීම්
19. සමගිය/ සහෝදරත්වය/ එකමුතු බව/ සහයෝගය/ කණ්ඩායම් හැඟීම්/ නායකත්ව ගුණාංග/ ගරු කිරීම
20. ඩෙංගු මර්දන ශ්‍රමදානය/ ක්‍රීඩා පිට්ටනිය පිරිසිදු කිරීම/ ඔසු උයන පිරිසිදු කිරීම ආදී ගැළපෙන පිළිතුරු

## II කොටස

01. (i) වෛද්‍ය සායනයක් (ii) වෛද්‍යවරයා, හෙදිය, සාත්තු සේවිකාවන් ආදී අදාළ නිවැරදි පිළිතුරු
(iii) AC (iv) BD (v) මළ ගෙදරක අවස්ථාවක් (vi) පාංශුකූලය දීම
(vii) මරණාධාර සමිති, සුබසාධක සමිතිය, බෞද්ධ සමිති වැනි නිවැරදි පිළිතුරු වලට ලකුණු දෙන්න.
(viii) සහෝදරත්වය/ වින්දනය/ කාලය ඉතිරිවීම/ මුදල් ඉතිරිවීම/ ආදී නිවැරදි පිළිතුරුවලට ලකුණු දෙන්න.(ල. 16)

02. (i) ක්‍රීඩා කමිටුව / විනය කමිටුව / ආගමික කමිටුව / බාලදක්ෂ කමිටුව ..... ආදී (ල. 04)
(ii) භෞතික - ඩෙස් පුටු/ පෙළපොත්/ පුස්තකාලය/ විද්‍යාගාරය
මානව - ගුරුභවතුන්/ නියෝජ්‍ය විදුහල්පති/ ශිෂ්‍ය ශිෂ්‍යාවන් (ල. 07)

03. (i) කලහකාරී බව/ බොරු කීම / කේන්ති යාම
(ii) උපදේශනය/ අගය කිරීම/ සිසුන් සමග මිත්‍රශීලී බව ඇති කිරීම / ආදරය කරුණාව දැක්වීම/ නායකත්වය ලබාදීම ආදී ගැළපෙන පිළිතුරුවලට ලකුණු දෙන්න.
(iii) (අ) මුදල් නොමැති කම/ තනිකම/ මව්පියන් විදේශ ගත වීම/ අසල්වැසියන් සමග සම්බන්ධතා නැතිවීම වැනි නිවැරදි පිළිතුරුවලට ලකුණු දෙන්න.
(ආ)
- පංති භාර ගුරු භවතා සමග ගැටළු කථා කිරීම
- හොඳම යහළුවාගේ යෙහෙළිය සමග කතා කිරීම
- උපදේශන භාර ගුරු භවතා සමග පැවසීම
- මවට පියාට හෝ පවුලේ විශ්වාස ඥාතියෙකුට පැවසීම ආදී ගැළපෙන පිළිතුරුවලට ලකුණු දෙන්න.

04. (i) 1. රාජ්‍ය ඔසුහල පිහිටුවීම 2. ගුරු ඇගයීම් කටයුතු
3. ලිපිනය තහවුරු කර ගැනීම 4. නිදහස් අධ්‍යාපනයේ පියා
5. සිසුන්ගේ සෞඛ්‍ය පරීක්ෂාව
(ii) යුතුකම් 1. ගුරුවරුන්ට කීකරු වීම 2. වැඩිහිටියන්ට සැලකීම
3. ප්‍රිය වචන කතා කිරීම
අයිතිවාසිකම් 1. අධ්‍යාපනය ලැබීම 2. දක්ෂතා දියුණුකර ගැනීම.
3. ආහාර හා පෝෂණය ලැබීම

05. (i) දෙමාපියන්/ සුබපතන්නන්/ ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්/ මහජන නියෝජිතයන්/ පූජනීය උතුමන්
(ii) මත්ද්‍රව්‍ය නිවාරණ වැඩ සටහන්/ ළමා අපයෝජන පිළිබඳ වැඩසටහන්
ළමා ආරක්ෂාව හා පෝෂණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්/ අනිවාර්ය අධ්‍යාපනය ලබා දීම පිළිබඳ දැනුවත් කිරීම්/ ඩෙංගු මර්ධනය පිළිබඳ දැනුවත් කිරීම් ආදී නිවැරදි පිළිතුරු වලට ලකුණු දෙන්න.

06. (i) බෞද්ධ සමිතිය / අවමංගල්‍යාධාර සමිතිය / සුභසාධක සමිතිය / ණය දෙන සමිති / යෞවන සමාජ (68 පිට)
(ii)

| | |
|---|---|
| සේවා සපයන අයගේ යුතුකම් | B, C, E, H |
| සේවා ලබන අයගේ යුතුකම් | A, D, F, G |

07. පහළට - 2. තාලය 3. අභියෝග 5. යහගුණ දම්
7. ප්‍රවාහන 8. අවමංගල්‍යාධාර
හරහට - 1. පාසල 3. අරමුණු 4. පරිගණකය
6. ගුරු සිසු 9. අයිතිවාසිකම් 10. ගඩොල්